ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
இலங்கை தேசிய கிறிஸ்தவ மன்றம்
National Christian Council of Sri Lanka

**එළඹෙන 2020 මහා මැතිවරණය පිළිබඳ ප්‍රකාශනය**

**ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය (NCCSL)**

2020 අගෝස්තු 05 වන දින පැවැත්වීමට නියමිත පාර්ලිමේන්තු මහා මැතිවරණයත් සමග අපේ රට යලිත් වරක් ඉතිහාසයේ තීරණාත්මක කාලපරිච්ඡේදයකට අවතීර්ණ වන අතර එහිදී එකම ජාතියක් ලෙස ඉදිරියට යෑමේදී ජනතාවගේ මනස විමසා සිටිමු.

ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය පුරවැසියන්ගේ ඡන්ද අයිතියේ ඇති පරමාදර්ශී වැදගත්කම පිළිගන්නා අතර සියලුම ඡන්දදායකයින්ගෙන් ඉල්ලා සිටිනුයේ, නිසි වගකීමෙන් යුතුව කල්පනාකාරීව තම ඡන්ද අයිතිය පාවිච්චි කරන ලෙසයි. ඔබ සැමට අවධානයෙන් සහ යාච්ඤාවෙන් යුතුව ක්‍රියාකිරීම පිණිස පහත කරුණු ඉදිරිපත් කිරීමට අපි කැමැත්තෙමු.

- සියලු ජනතාවන් හට අභිමානයෙන් හා සමානාත්මතාවයෙන් යුතුව ජීවත් වීම පිණිස, ඔවුනගේ අභිලාෂයන් සහ අයිතිවාසිකම් සුරක්ෂිත වන පාලනයක් සහතික කරන්නට ජනතා ඡන්දයෙන් තේරී පත් වන පුද්ගලයන් වගබලා ගත යුතුය. අප දේශයේ බහු වාර්ගික හා බහු ආගමික විවිදත්වය සලකා බැලීමේදී, දේශය පාලනය සඳහා පත්වන නායකත්වය එකී යථාර්තයන් පිළිබඳව පූර්ණ අවබෝධයක් ලබා ගැනීම අතිශයින්ම අත්‍යවශ්‍ය වන අතරම, විවිදත්වයේ ඇති වටිනාකම් හා සාරධර්ම සුරකිමින් ආදර්ශමත් ලෙස වෙනස් කොට සැලකීමෙන් තොරව සහජීවනය උදෙසා කැප විය යුතු වේ. අප නැවතත් මතක්කොට සිටිනුයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය ක්‍රියාත්මක කරවීම, භාෂා අයිතිවාසිකම් සහ බලය බෙදාහැරීම සම්බන්ධයෙන් ද්‍රවිඩ ජනතාවගේ ඉල්ලීම් සාධාරණ ලෙස සපුරාලීමය.

- පරිසරය සහ භූමිය යනු ඕනෑම රටක ජීවනෝපාය සහ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය මූලික සම්පත් වේ. එබැවින් ජීවිතය හා ජීවත්වීම සබැඳි එවන් කාරණා වෙනුවෙන් වගකිවයුතු පුරවැසියන් ලෙස පරිසරය ආරක්ෂා කිරීම, ජීවය සුරක්ෂිත කිරීම සහ පොදුවේ මහා ජනතාවගේ යහපත සඳහා ඉඩම් නිසිලෙස පරිහරණය කිරීමට නායකත්වය ලබා දීම, ඡන්දයෙන් තේරී පත් වන පුද්ගලයන්ගේ වගකීම වෙයි.

- ප්‍රජාතන්ත්‍රවාදය නිසි ලෙස පවත්වාගෙන යෑමටත්, නීතියේ ආධිපත්‍යය පවත්වා ගැනීමටත්, ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය වෙත පවරා ඇති බලතල වල සීමාවන් වෙන් කිරීම සහ ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් වෙයි. සුදුසුකම් ලත් චන්දදායකයින් වශයෙන් මෙම වැදගත් ව්‍යවස්ථාමය මූලධර්මයන්, වැනෙන සුළු තත්වයන්ට පත්කරන්නා වූ සම්මුතියන්ට යට වීමට ඉඩ

නොදී, තව තවත් එකී වැදගත් ව්‍යවස්ථාමය මූලධර්මයන්, ශක්තිමත් කිරීම හා ප්‍රවර්ධනය කිරීම කල යුතු වේ.

- වර්ෂ 2015 දී, දේශපාලන බෙදීම් හරහා බහුතර පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ද සහයෝගය ඇතිව සම්මත කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින්, විධායක ජනාධිපති ධුරයේ අතිරික්ත බලතල සීමා කිරීම, ව්‍යවස්ථාදායකයේ බලතල ශක්තිමත් කිරීම, වැදගත් ස්වාධීන කොමිෂන් සභා හඳුන්වා දීම මෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතියද ලද බව අප පිළිගනිමු. එය මෑත වසර වලදී මහජනයා තුල වූ වගකීම් සහගත බව පෙන්වමින් ඔවුන් සවිබල ගැන්වීමට දිරියක් ද විය.

- ඇතිවූ ගෝලීය වසංගත තත්වය හමුවේ දැනට උද්ගත වී ඇති තත්වය අනුව ඡන්දය ප්‍රකාශ කිරීමට යොමු වන ජනතාවගෙන් ඉල්ලා සිටිනුයේ, ඔබගේ ඡන්ද අයිතිය ක්‍රියාත්මක කිරීමට සෑම උත්සාහයක්ම ගන්නා අතරම මාරාන්තික නව කොරෝනා වෛරසයට එරෙහිව සටන් කිරීමේදී එයට නියමිත සෞඛ්‍යාරක්ෂක මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපදින ලෙසයි. මෙවැනි අභියෝගාත්මක අවස්ථාවන් වලදී නිදහස් සහ සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට මැතිවරණ කොමිෂන් සභාව දක්වන කැපවීම පිළිබඳ අප ප්‍රශංසා කරන අතරම ඉදිරි සති කිහිපය තුල එහි සාමාජිකයන් හට අපේ නිරන්තර යාච්ඤාවන් සහ සහයෝගය සහතික කරමු.

මැතිවරණය සාමකාමීව පැවත්වෙනු ඇති බවත්, අප ආදරණීය මවුබිම තුල සාමය හා සමගිය සාමූහිකව ප්‍රවර්ධනය කල හැකි, ජීවත්වීමේ අයිතිය සුරකින, වගකිවයුතු පාර්ලිමේන්තුවක් පත් කර ගැනීම වෙනුවෙන්, බුද්ධිමත්ව තම මනාපය ප්‍රකාශ කිරීමට මහජනතාවට හැකිවනු ඇතැයි අපගේ එකම බලාපොරොත්තුව හා යාච්ඤාවයි.

2020 ජූලි 30 වන දින

අත්සන් කරන ලද්දේ:

**සාමාජික සභාවන්**

- ගරු හේෂාන් ද සිල්වා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා බැප්ටිස්ට් සංගමය සහ සභාපති - ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය
- අතිගරු ඩී. ආර්. කනගසබෙයි - නායක අගරදගුරුතුමන්ගේ කොමිසාරි සහ පාළක රදගුරු ජනරාල්

  හිම්පානන් - ලංකා සභාව, කොළඹ දියෝකීසිය
- අතිගරු කීර්තිසිරි ප්‍රනාන්දු රදගුරුතුමා - ලංකා සභාව, කුරුණෑගල දියෝකීසිය
- අතිගරු ධර්මාචාර්ය ඩැනියල් එස්. තියාගරාජා රදගුරුතුමා දකුණු ඉන්දියානු සභාව - යාපනය දියෝකීසිය
- ගරු සමන් පෙරේරා දේවගැතිතුමා - පරිනියාමක/සභාපති, ශ්‍රී ලංකා ප්‍රෙස්බිටේරියන් සභාව
- ගරු ආසිරි පී. පෙරේරා දේවගැතිතුමා - මහ නායකතුමා/රදගුරුතුමා ශ්‍රී ලංකා මෙතෝදිස්ත සභාව
- ගරු ෂර්ලි එස්. ෆේබර් දේවගැතිතුමා - සභාපති, ක්‍රිස්තියානි රෙපරමාදු සභාව
- කර්නල් සූරේශ් පාවිර - ප්‍රාදේශීය භාර මූලිකතුමා, ගැලවීමේ හමුදාව
- ගරු මැක්ස්වෙල් ඩොස් දේවගැතිතුමා - මහ ලේකම්, ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය

**සාමාජික සාමයික සංවිධාන**

- තරුණ ක්‍රිස්තියානි සංගමය (YMCA)
- තරුණ කාන්තා ක්‍රිස්තියානි සංගමය (YWCA)
- ලංකා බයිබල් සමාගම
- ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය පිළිමතලාව
- ශිෂ්‍ය ක්‍රිස්තියානි ව්‍යාපරය (SCM)
- ලංකා ක්‍රිස්තියානි සාහිත්‍ය සමාගම
- ජීවිතාලෝකය

**සහකාර/අසුරු සභාවන් සහ සාමයික සංවිධාන**

- ගරු ඩී. නඩරාජා දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා ලූතරන් සභාව
- ගරු මයිකල් දිසානායක දේවගැතිතුමා - සභාපති, ජනතා දේව සභාව
- ගරු ලෙස්ලි කීගල් දේවගැතිතුමා - සභාපති, ශ්‍රී ලංකා සිව් චතුරශ්‍ර සභාව
- ගරු ඩී. දේවනේසන් දේවගැතිතුමා ඇමරිකන් සිලොන් මිෂන් සභාව
- යොවුන් කිතු මඟ
- දේවධර්ම ශාස්ත්‍රාලය කොළඹ

#368/6, Bauddhaloka Mawatha, Colombo 7, Sri Lanka.
Telephone: +94 (11) 2671723 Fax: +94 (11) 2671721
E-Mail: info@nccsl.org | Website: www.nccsl.org